# බදු සමා පනතට පෙර ඉදිරිපත් කළ ආදායම් වාර්තා අධිකරණය හමුවට පමුණුවන ලෙස ඉල්ලති

අල්ලස් හෝ දූෂණ විමර්ශන පනතේ විෂය පථය යටතේ වන 2003 අංක 10 දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) පනත ක්‍රියාත්මකවීමට පෙර දස වසර තුළ තිල දැරූ රජයේ ශුල්කයකු දේශීය ආදායම් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරන ලද ප්‍රකාශන සහ එම කාලය තුළ ඔවුන් වත්කම් හා බැරකම් පනත යටතේ කරන ලද ප්‍රකාශ විනිමය පාලකවරයාටත්, අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසමේ සභාපතිවරයාට සහ නීතිපතිවරයාටත් ඉදිරිපත් කරන ලෙස දේශීය ආදායම් කොමසාරිස්වරයාට මන්ඩාමුස් රිට් ආඥාවක් නිකුත් කරන ලෙස ඉල්ලා සිටිමින් වරලත් ගණකාධිකාරිවරයෙකු, වරලත් ගණකාධිකාරී ආයතනයේ හා එක්සත් රාජධානියේ වරලත් ගණකාධිකාරී කළමනාකරණ ආයතනයේ අධි සාමාජික හා ලෝක බැංකුවේ සහ මුදල් අමාත්‍යාංශයේ හිටපු උපදේශකවරයකු වන නිහාල් ශ්‍රී අමරසේකර මහතා අභියාචනාධිකරණයෙන් ඉල්ලා සිටී.

නිහාල් ශ්‍රී අමරසේකර මහතා මීට පෙර බදු වංචාකරුවන්ට සමාව දීමට මුදල් ඇමතිවරයාට බලය ලබාදීම සඳහා ඉදිරිපත් කරනු ලැබූ පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගයන්ට පටහැනිව සිදු කිරීම මගින් පනත සම්මත කිරීමට පෙර ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ විරෝධතා ගොනු කිරීම පොදු මහජනතාවට අහිමි කර ඇතැයි ප්‍රකාශ කරන ලෙස ඉල්ලා ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ද ගොනු කර තිබුණි.

එම දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) පනත යටතේ බදු සමාව ඉල්ලා සිටීමේ කාලය දීර්ඝ කිරීමට ද එරෙහිව නිහාල් ශ්‍රී අමරසේකර මහතා ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කළේය.

මෙවර ඔහු අභියාචනාධිකරණයට ඉදිරිපත් කර ඇති අයදුම් පනත මගින් ඉහත මණ්ඩාමුස් (රිට්) ආඥාවක් ඉල්ලීමට අමතරව දේශීය ආදායම් සංශෝධන පනත යටතේ ප්‍රකාශ කර ඇති ප්‍රකාශනකරුවන්ට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 වගන්තිය අනුව ජනාධිපතිනිය විසින් පමණක් දිය හැකි, දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම් කළ හැකි යම් වැරදි සම්බන්ධයෙන් හා නීතිපති විසින් තීරණය කළ හැකි වංචාවෙන් ඉපැයූ මුදල් වසන් කිරීම, මත්ද්‍රව්‍ය, මත්කුඩු හා නීති විරෝධී මත්පැන් ජාවාරම්වලින් මුදල් ඉපැයීම වැනි පුද්ගලයන්ට සමාව දීම වළක්වන තහනම් ආඥා රේගු අධ්‍යක්ෂ ජනරාල්, සුරාබදු කොමසාරිස්, ආනයන අපනයන පාලක, විනිමය පාලක, මහ බැංකු අධිපති, මුදල් ඇමති හා අමාත්‍යාංශ ලේකම් හා නීතිපති වෙත නිකුත් කරන ලෙස ද ඉල්ලා සිටී. ■

ලංකාදීප

2003 සැප්තැම්බර් මස 30 වැනිද අඟහරුවාද

# බදු සහන බලරහිත කිරීමේ රිට් ආඥාවක් ඉල්ලා පෙත්සමක්

(රත්නපාල ගමගේ)

දේශීය ආදායම්, රේගු, සුරාබදු, ආනයන, අපනයන, විනිමය පාලන, මහ බැංකුව යන ආයතන විසින් ප්‍රදානය කර ඇති බදු සහන බල රහිත කරන රිට් ආඥාවක් නිකුත් කරන ලෙස ඉල්ලා කොළඹ විපුලසේන මාවතේ පදිංචි නිහාල් ශ්‍රී අමරසේකර මහතා අභියාචනාධිකරණයේ පෙත්සමක් ගොනු කර තිබේ.

මෙම පෙත්සමේ වගඋත්තරකරුවන් ලෙස දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්, රේගු අධ්‍යක්ෂ ජනරාල්, සුරාබදු අධ්‍යක්ෂ ජනරාල්, ආනයන හා අපනයන පාලක, විනිමය පාලක, මහ බැංකු අධිපති, භාණ්ඩාගාරයේ ලේකම්, මුදල් ඇමැති සහ නීතිපතිවරයා නම් කරනු ලැබ තිබේ.

2003 අංක 10 දරණ දේශීය ආදායම් විධිවිධාන පණත යටතේ 2003 ජූලි 1දා සිට අගෝස්තු 31දා දක්වා වත්කම් ප්‍රකාශ කළ අය සඳහා බදු සහනයන් ලබාදී ඇති බවත් එම බදු සහන ප්‍රදානය කිරීම නීතියට පටහැනි බවත් සඳහන් කරන පෙත්සම්කරු බදු සහන ලබාදීම සඳහා පරීක්ෂණ පැවැත්වීම, නඩු පැවරීම, වරදකරු කිරීම සම්බන්ධයෙන් සමාවක් ප්‍රදානය කළ හැකි වන්නේ ජනාධිපතිනියට පමණක් බවත් එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 වගන්තිය යටතේ පැහැදිලිව දක්වා ඇති බවත් සඳහන් කරයි.

මේ නිසා ඉහත සඳහන් කාලය තුළ වගඋත්තරකරුවන් විසින් ප්‍රදානය කර ඇති බදු සහනයන් නීත්‍යානුකූල නොවන හෙයින් එම බදු සහන ප්‍රදානයන් බල රහිත කිරීමේ රිට් ආඥාවක් නිකුත් කරන ලෙසටත් පෙත්සමෙන් ඉල්ලා තිබේ.

ලක්බිම 2003 ඔක්තෝබර් 31 සිකුරාදා

### දේශීය ආදායම් කොමසාරිස්ට රිට් ආඥාවක් නිකුත් කරන මෙන් ඉල්ලා ගොනුකළ පෙත්සම

# නීතිපතිට ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙනී සිටින ලෙසට නොතීසි

❑ දයා අබේරත්න

**පසුගියද** පාර්ලිමේන්තුවෙන් සම්මත කරගනු ලැබූ දේශීය ආදයම් (විශේෂ විධි විධාන) පනත අනුව පසුගිය ජූනි මස 30 දට පෙර ආදයම් බදු ගෙවන්නන්ගෙන් ලබා ගන්නා ලද ප්‍රකාශ අවලංගු කරන ලෙසත්, එම ප්‍රකාශ සම්බන්ධයෙන් කරනු ලැබූ සියලුම ක්‍රියා අහෝසි කරන ලෙසත්, දන්වමින් දේශීය ආදායම් කොමසාරිස්වරයා වෙත රිට් ආඥාවක් නිකුත් කරන ලෙස ඉල්ලමින් වරලත් ගණකාධිකාරීවරයෙකු හා ලෝක බැංකුවේ මූල්‍ය කටයුතු පිළිබඳ උපදේශකවරයෙකු වන නිහාල් ශ්‍රී අමසේකර මහතා විසින් ඉදිරිපත් කර තිබූ පෙත්සමේ වගඋත්තරකරුවකු වූ නීතිපතිවරයාට ලබන මස 10 දින අධිකරණයේ පෙනී සිටින ලෙසට අභියාචනාධිකරණය නොතීසි නිකුත් කළේය. නිහාල් ශ්‍රී අමරසේකර මහතා විසින් ඉදිරිපත් කර තිබූ එම පෙත්සම සලකා බැලීමෙන් අනතුරුව එම නොතීසි නිකුත් කෙරිණ.

මෙම පෙත්සමේ වගඋත්තරකරුවන් වශයෙන් දේශීය ආදයම් කොමසාරිස් ජෙනරාල් කන්දසියා සුසිලර්, ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ ජෙනරාල්, එස්.ඒ.සී.එස්.ඩබ්ලිව්. ජයතිලක, සුරාබදු කොමසාරිස් පරාක්‍රම බණ්ඩාර ඒකනායක, ආනයන හා අපනයන පාලක රන්ජන් සමරවීර, විනිමය පාලක් එච්.ඒ.ජී. හෙට්ටිආරච්චි, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ඒ.එස්. ජයවර්ධන, අල්ලස් හා දූෂණ චෝදනා විමර්ෂණ කොමිසමේ සභාපති ආනන්ද කුමාරස්වාමි, මුදල් අමාත්‍යංශයේ හා මහා භාන්ඩාගාරයේ ලේකම් චරිත රත්වත්තේ මුදල් ඇමැති කේ.එන්. චොක්සි, පාර්ලිමේන්තුවේ කථානායක ජෝශප් මයිකල් පෙරේරා, ජනාධිපති කාර්යාලීය ලේකම් ඩබ්ලිව්.ජේ.එස්. කරුණාරත්න, නීතිපති ජනාධිපති නීතිඥ කේ.සී. කමලසබේසන් යන මහත්වරු නම් සඳහන් කර තිබේ.

පාර්ලිමේන්තුවෙන් සම්මත කර ගන්නා ලද ඉහත සඳහන් පනත අනුව 1 වන වගඋත්තරකරු වූ දේශීය ආදයම් කොමසාරිස් ජෙනරාල්වරයාට බදු ගෙවන්නන් හා යම් යම් වැරදිවලට ලක් වුවත් විසින් ලිඛිත ප්‍රකාශ කළ යුතුව තිබෙන බවත්, එම ලිඛිත ප්‍රකාශ ලැබුණ විට ඒවාට ඔහු විසින් එකී ලිඛිත ප්‍රකාශ පිළිගෙන එහි ආදයම් බදු ගෙවන්නන්ට සමාව ප්‍රදානය කළ යුතු බවත් සිය පෙත්සමෙන් කියා ඇති අමරසේකර බදු ගෙවන්නන් විසින් කරනු ලබන එම ප්‍රකාශ වන්නේ තමන් විසින් රජයට ගෙවිය යුතු බදු ගෙවීමට නොහැකි බවට හේතු දක්වමින් කරන ලද ප්‍රකාශ මත බවත් කියා තිබේ.

පෙත්සම්කරු නිහාල් ශ්‍රී අමරසේකර මහතා සිය පෙත්සමෙන් මෙසේද කියා තිබේ.

මා මෙම පෙත්සම අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කොට අනුගමනය කිරීමට ජාතික අභිවෘද්ධිය වර්ධනය කිරීම, පොදු දේපොළ ආරක්ෂා කිරීම හා පොදු දේපොළ අයථා පරිදි ප්‍රයෝජනයට ගැනීමට යනානායේති කිරීමට එරෙහිව ක්‍රියා කිරීම පිණිසයි.

පාර්ලිමේන්තුවේ සම්මත කරනු ලැබූ එකී පනත අනුව වගඋත්තරකරුවන් යටතට ගැනෙන යම් යම් වැරදිවලට අසු වුවන් එම වැරදිවලට සමාවක් ඉල්ලමින් ප්‍රකාශයක් කිරීමට අයිතිය ලැබෙනවා. එම ප්‍රකාශයන් කුමක් වුවත් ඒවා පිළිගැනීමට ඒ වගඋත්තරකරුවන්ට හැකියාව තිබෙනවා. ඒ අනුව ආදයම් බදු පමණක් නොව දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම් කරනු ලැබිය හැකි මුදල් විශෝධනය, මුහුදු කොල්ලය, මත්ද්‍රව්‍ය, ඖෂධ හුවමාරුව, නීති විරෝධී මත්පැන් පෙරීම, නීති විරෝධී මත්පැන් විකිණීම, අයථා මනුෂ්‍ය ගනුදෙනු කිරීම් ත්‍රස්තවාදීන් හා ත්‍රස්තවාදී ව්‍යාපාරවලට මුදල් යෙදවීම සම්බන්ධයෙන් වූ දඬුවම් කළ හැකි වැරදි සම්බන්ධයෙන් සමාවක් ඉල්ලා ඒවාට සම්බන්ධ පුද්ගලයන්ට සමාවක් ඉල්ලා ප්‍රකාශ කළ හැකියි. එසේම ඔවුන්ගේ ප්‍රකාශ පිළිගෙන ඒ ඒ වගඋත්තරකරුවන්ට සමාව දීමට ද හැකියාව තිබෙනවා.

මෙම සංශෝධන පනත පාර්ලිමේන්තුවෙන් සම්මත වූ පසු පසුගිය ජූලි 30 දක්වා අදළ අයට එකී ප්‍රකාශ ඉදිරිපත් කිරීමට කල් දී තිබෙනවා. ඊට පසු එම කාලය පසුගිය අගෝස්තු 15 ද දක්වා කල් ලබා දුන්නා. එසේ කල් ලබා දුන්නේ මෙම පනත සම්බන්ධයෙන් වූ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව ලැබෙන තෙක් පමණි. පනත ව්‍යවස්ථාවට පටහැනි බවක් කියමින් ඉදිරිපත් කළ පෙත්සමේ තීන්දුව වූයේ එය ව්‍යවස්ථාවට පටහැනි නොවන බවයි. පනත ව්‍යවස්ථාවට පටහැනි නොවන බව ශ්‍රේෂ්ඨාධිකරණය පාර්ලිමේන්තුවට දන්වා තිබුණි. ඊට පසුව පනත පාර්ලිමේන්තුවෙන් සම්මත වුවත් පනතට කතානායකවරයා සිය අත්සන යොදා එයට අනුමැතිය ලබා දී නැත.

ඒ අනුව මා පහත සඳහන් ඉල්ලීම් අභියාචනාධිකරණයෙන් අයැද සිටිමි.

වගඋත්තරකරුවන්ට නොතීසි නිකුත් කරන්න.

මෙම පනත යටතේ 2003.07.01 දින සිට 2003.8.31 වන දින දක්වා වූ කාලය තුළ 1 වන වගඋත්තරකාර දේශීය ආදයම් කොමසාරිස් ජෙනරාල්වරයා වෙත ප්‍රකාශකරුවන් විසින් ඉදිරිපත් කරන ලද ප්‍රකාශ වන 1, 2, 3, 4, 5, 6, 8, 9, 12 වගඋත්තරකරුවන් විසින් හෝ ඔවුන්ගේ බලයලත් නිලධාරීන්, නියෝජිතයන්, සේවකයන් හා ඔවුන් යටතේ ක්‍රියාකරන අය විසින් දෙන ලද හෝ ඉටු කරන ලද සියලු ක්‍රියාවන් අහෝසි කරමින් සර්ටියෝරාරි රිට් ආඥාවක් නිකුත් කරන්න. එසේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 වන වගන්තිය අනුව ජනාධිපතිවරයාට පමණක් සමාවක් දිය හැකි දණ්ඩ නීති සංග්‍රහයක් යටතේ දඬුවම් ලැබිය හැකි වැරදි වූ මුදල් විශෝධනය මුහුදු කොල්ලය, මත්ද්‍රව්‍ය හා ඖෂධ හුවමාරුව, නීති විරෝධී මත්පැන් පෙරීම; නීති විරෝධී මත්පැන් විකිණීම, අයථා මනුෂ්‍ය ගනුදෙනු කිරීම්, ත්‍රස්තවාදීන්ට හා ත්‍රස්තවාදී ව්‍යාපාරවලට මුදල් යෙදවීම සම්බන්ධයෙන් 12 වන වගඋත්තරකරු විසින් තීරණය කරනු ලබන වෙනත් වරදවල්වලට සමාව දීම අහෝසි කිරීමේ සර්ටියෝරාරි ආඥාවක් නිකුත් කරන ලෙස අයැද සිටිමි. එසේම එකී පනත යටතේ 2003.07.01 දින සිට 2003.08.31 දින කාලය තුළ 1 වන වගඋත්තරකාර අදයම් කොමසාරිස් ජෙනරාල්වරයා වෙත බාර දුන් ප්‍රකාශවරුන්ට ඔවුන්ගේ ප්‍රකාශ වෙනුවෙන් සමාව දීම වගඋත්තරකරුවනට තහනම් කරමින් අතුරු තහනම් නියෝගයක් නිකුත් කරන ලෙස අයැද සිටිමි.

නඩු ගාස්තු හා අධිකරණයට සුදුසු යැයි හැඟෙන වෙනත් සහනද ලබා දෙන ලෙස අයැද සිටිමි.

පෙත්සම්කරු වෙනුවෙන් අධිනීතිඥ එම්.ඒ. සුමන්තිරම් මහතා අභියාචනාධිකරණයට කරුණු දැක්වීය.

කේ. ශ්‍රීපවන් හා උදලාගම යන විනිශ්චයකාරවරුන්ගෙන් අභියාචනාධිකරණය සැදුම් ගත වී තිබිණ.

වැඩිදුර විභාගය ලබන නොවැම්බර් 10 දිනට කල් තැබිණි.

# පනතට කතානායක අස්සන් කර නැති නිසා බදු සමා පිරිනැමීම තහනම් කරන්න

## අතුරු තහනමක් ඉල්ලා ගොනු කළ පෙත්සමේ වගඋත්තරකරුවන්ට නොතීසි

(ගීතානි පෙරේරා)

පාර්ලිමේන්තුව විසින් පසුගිය අගෝස්තු 21 වන දින සාමාන්‍ය වැඩි ඡන්දයෙන් සම්මත කරනු ලැබූ බදු සමා ප්‍රදානයට අදාළ 2003 අංක 10 දරණ දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) සංශෝධන පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වන වගන්තියෙන් නියමිතව ඇති පරිදි කථානායකවරයා අත්සන් තබා නොමැති බව දැනගන්නට ලැබී ඇති හෙයින් 2003 ජූලි 1 වැනිදා සිට 2003 අගෝස්තු 31 වැනිදා දක්වා කාලය තුළ වත්කම් පිළිබඳ තොරතුරු ප්‍රකාශ කරන්නන් වෙත බදු සමාවක් ප්‍රදානය කිරීම තහනම් කරන ලෙස ඉල්ලමින් ගොනුකර තිබූ පෙත්සමක් සලකා බැලූ අභියාචනාධිකරණ විනිසුරුවරුන් වන එන්. කේ. උදලාගම සහ කේ. ශ්‍රී පවන් යන මහත්වරු එම පෙත්සමේ වගඋත්තරකරුවන්ට නොවැම්බර් 10 වන දින අධිකරණයේ පෙනී සිටින ලෙස නොතිසි නිකුත් කිරීමට නියෝග කෙරිණි.

ව්‍යාපාර සහ කළමනාකරණ උපදේශකවරුන් වන කොළඹ මරදාන විපුලසේන මාවතේ පදිංචි නිහාල් ශ්‍රී අමරසේකර මහතා විසින් මෙම පෙත්සම ගොනුකර ඇත.

මෙහි වගඋත්තරකරුවන් වශයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් කන්දයියා සුසිලර්, ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ ජනරාල් එස්. ජී. පී. එස්. ඩබ්ලිව්. ජයතිලක, සුරාබදු කොමසාරිස් පරාක්‍රම ඒකනායක බණ්ඩාර, අපනයන සහ ආනයන පාලක රන්ජන් සමරවීර, විනිමය පාලක එච්. ඒ. ජී. හෙට්ටිආරච්චි, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ඒ. එස්. ජයවර්ධන, අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ සභාපති ආනන්ද කුලසූරිය, මහා භාණ්ඩාගාරයේ සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම් චරිත රත්වත්ත, මුදල් අමාත්‍ය කේ. එන්. චොක්සි, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක ජෝෂප් මයිකල් පෙරේරා, ජනාධිපති කාර්යාලීය ලේකම් ඩබ්ලිව්. ජේ. එස්. කරුණාරත්න, නීතිපති කේ. සී. කමලසබේසන් යන මහත්වරු නම් කරනු ලැබ සිටිති.

මෙතෙක් ප්‍රකාශ නොකළ හෝ සැඟවූ වත්කම් සහ ආදායම් ප්‍රකාශ කරන්නන්ට බදු සමාවක් ලබාදෙන බව ප්‍රකාශ කරමින් 2003.06.30 වන දින දක්වා එකී ප්‍රකාශ කරන්නන්ට කාලය ලබාදුන් 2003 අංක 10 දරණ පනත පසුගිය අගෝස්තු 31 වැනිදා පාර්ලිමේන්තුව මගින් වැඩි ඡන්දයෙන් සම්මත කළ බව පෙත්සම්කරු කියා සිටී.

එම පනතේ විධිවිධාන අනුව 2003.07.01 දින සිට 2003.08.31 වන දින දක්වා ප්‍රකාශ කරන්නන්ට බදු සමාව ලබාදීමට නියමිතව තිබූ බව පෙත්සමෙහි සඳහන්ය.

එසේ වුවද එම පනත් කෙටුම්පත සම්මතවීමෙන් පසුව කථානායකවරයා ඊට සිය අත්සන යොදා එකී පනත් කෙටුම්පත සහතික කර නොමැති බව විශ්වාස කටයුතු ලෙස දැනගන්නට ලැබී ඇතැයිද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වන වගන්තියට අනුව කථානායකවරයා එකී වගකීම සිදුකර නොමැති හෙයින් අදාළ පනත් කෙටුම්පත නීතියක් ලෙස සැලකිය නොහැකි යැයිද පෙත්සම්කරු කියා සිටී.

ඒ අනුව 2003.07.01 සිට 2003.8.31 දක්වා ආදායම් හා වත්කම් සම්බන්ධ බදු සමාවක් අපේක්ෂිතව තොරතුරු ප්‍රකාශ කර ඇත්තන්ට බදු සමා ලබාදීම සඳහා කිසිදු ආකාරයකින් කටයුතු කළ නොහැකි බවද පෙත්සම්කරු සඳහන් කර ඇත.

එබැවින් මෙම පෙත්සමේ වගඋත්තරකරුවන් හෝ ඔවුන්ගෙන් බලයලත් නිලධාරීන් අදාළ කාල සීමාව තුළ තොරතුරු ප්‍රකාශ කළ බදු සමා අපේක්ෂිතයන් පිළිබඳව කවරාකාර හෝ කටයුත්තක යෙදීම අහෝසි කෙරෙන සර්ටියොරාරි රිට් ආඥාව නිකුත් කරන ලෙසද එකී වගඋත්තකරුවන් කිසියම් පුද්ගලයකු වෙත සමාවක් වගකීමෙන් නිදහස් කිරීම, ප්‍රකාශ කිරීම වළක්වන සර්ටියොරාරි රිට් ආඥාවක් නිකුත් කරන 2003.07.01 සිට 2003.08.31 දක්වා කාලය තුළ පළමුවැනි වගඋත්තකරු වෙත බාරදුන් ප්‍රකාශ පිළිබඳව බලයලත් වෙනත් නිලධාරීන් හෝ කටයුතු කිරීම තහනම් කරන රිට් ආඥාවක් නිකුත් කරන ලෙසද 2003 අංක 10 දේශීය ආදායම් සංශෝධන පනත සම්බන්ධයෙන් වගඋත්තකරුවන් යම්කිසි තීරණ ගැනීම වළකාලන අතුරු තහනම් නියෝගයක් නිකුත් කරන ලෙසද පෙත්සම්කරු අධිකරණයෙන් ඉල්ලා සිටී.